# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

## විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යාංශය

### ජපානයේ රැකියා අවස්ථා සඳහා බඳවාගැනීමේ යෝග්‍යතා පරීක්ෂණය

**විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ IM Japan ආයතනය (International Manpower Development Organization) සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව ජපානයේ රැකියා අවස්ථා සඳහා කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභීන් යොමු කිරීමේ වැඩසටහනට අදාලව සාත්තු සේවිකා සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා කාණ්ඩයේ රැකියා අපේක්ෂකයින් සඳහා පහත පරිදි රැකියා අවස්ථා කාර්යාංශය වෙත ලැබී ඇත.**

**01. සාත්තු සේවිකා - රැකියා අවස්ථා සංඛ්‍යාව 33 (කාන්තා පමණි)**

- ජපන් භාෂා ප්‍රවීණතාව JLPT 4 හෝ NAT 4 සමත් වීම හෝ ඊට ඉහල සුදුසුකම්
- බඳවාගැනීම් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් පමණි
- කිසිදු අයකිරීමක් නොමැත
- ශරීරයේ Tattoo නොතිබිය යුතුය
- වයස අවු. 18 – 30 අතර විය යුතුය
- අපොස උ/පෙළ විභාගය සඳහා පෙනී සිටි අය විය යුතුය
- උස 150cm හෝ ඊට වැඩි විය යුතුය

**02. ඉදිකිරීම් ක්ෂේත්‍රය - රැකියා අවස්ථා සංඛ්‍යාව 02 (පිරිමි පමණි)**
**(Construction - Scaffolding)**

- වයස අවු. 18 – 30 අතර විය යුතුය
- ශරීරයේ Tattoo නොතිබිය යුතුය
- අපොස උ/පෙළ විභාගය සඳහා පෙනී සිටි අය විය යුතුය
- බඳවාගැනීම් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් පමණි
- කිසිදු අයකිරීමක් නොමැත
- උස 160cm හෝ ඊට වැඩි විය යුතුය

**ඒ අනුව සාත්තු සේවිකා සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා කාණ්ඩ සඳහා ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, පෙර විගමණික පුහුණුව සඳහා බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණයේ ඉදිරි පියවර 2018 අගෝස්තු මස 09 දින පෙ.ව 07.30 සිට "තලාහේන මධ්‍ය මහා විද්‍යාලයීය ක්‍රීඩාංගනය, මාලබේ" යන ස්ථානයෙහි පැවැත්වීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය කටයුතු සූදානම් කර ඇත. අදාල රැකියා කාණ්ඩ සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ඔබ පහත ලිපිලේඛන සහිතව දන්වා ඇති පරිදි සූදානම් වී යෝග්‍යතා පරීක්ෂණය සඳහා යොමු වන ලෙස මෙමඟින් දන්වා සිටිමු.**

- **2018.08.09 දින ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කිරීම**

**මෙදින ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා අයදුම්කරුවන් පෙ.ව. 07.30වන විට තලාහේන මධ්‍ය මහා විද්‍යාලයීය ක්‍රීඩාංගනය වෙත පැමිණිය යුතු අතර පහත කරුණු අනුගමනය කල යුතුය.**
**(පෙ.ව.07.30න් පසු මෙම පරීක්ෂණ සඳහා පැමිණෙන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් නොලබන බව කාරුණිකව සලකන්න)**

- ✓ මෙහිදී පැවැත්වෙන දිවීමේ සහ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ සඳහා යොමු වන සියළුම අයදුම්කරුවන් ඒ සඳහා Track Bottom , සුදු පැහැති T shirt සහ කැන්වස් සපත්තු පැළඳිය යුතුය.

| | Running | Push up | Sit up |
|---|---|---|---|
| **Male** | 3Km within 15 minutes | Continuously 35 times | Continuously 25 times |
| **Female** | 1.5Km within 10 minutes | Continuously 15 times | Continuously 15 times |

- ✓ අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සඳහා යොමු වීමට සුදුසු බව තහවුරු කිරීම සඳහා රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකු මඟින් ලබාගත් වෛද්‍ය සහතිකයක් (Medical Fitness Certificate) රැගෙන ආ යුතුය.
- ✓ තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු ගමන් බලපත්‍රය රැගෙන ආ යුතුය.
- ✓ සාත්තු සේවිකා රැකියා කාණ්ඩය සඳහා ජපන්භාෂා ප්‍රවීණතාව N4 හෝ ඊට ඉහල සුදුසුකම් පිළිබඳ සහතික සහ ඒවායේ ඡයා පිටපත්.
- ✓ පාසල් හැරයාමේ සහතිකයේ මුල් පිටපත , අ.පො.ස උසස්පෙල විභාගය සඳහා පෙනී සිටි සහතිකය සහ ඒවායේ ඡයා පිටපත්

***පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය -*** **තලාහේන මධ්‍ය මහා විද්‍යාලයීය ක්‍රීඩාංගනය, මාලබේ**

- **2018.08.09 දින ගණිත හැකියාව හා ජපන්භාෂා ප්‍රවීණතාවය පරීක්ෂා කිරීම**

මෙදින ගණිත හැකියාව හා ජපන්භාෂා ප්‍රවීණතාවය පරීක්ෂා කිරීම **තලාහේන මධ්‍ය මහා විද්‍යාලයේදී** පැවැත්වෙන අතර **ක්‍රීඩාංගනයේදී පැවැත්වෙන යෝග්‍යතා පරීක්ෂණ සාර්ථකව අවසන් කල අයදුම්කරුවන් පමණක්** මෙම පරීක්ෂණය සඳහා යොමු විය යුතුය. ඒ සඳහා පහත කරුණු අනුගමනය කල යුතුය.

01. තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු ගමන් බලපත්‍රය
02. කළු පෑනක් රැගෙන පැමිණිය යුතුය

**සැලකිය යුතුයි - යම් අයදුම්කරුවෙකු 2018.07.31 දින වන විට වයස අවුරුදු 18ත් 30ත් අතර වයස් කාණ්ඩයේ නොමැති සහ අ.පො.ස උසස් පෙළ විභාගය සඳහා පෙනී නොසිටි අයදුම්කරුවෙකු නම් ඔවුන් මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් නොලබන බැවින් මෙදින නොපැමිණෙන ලෙස අවධාරණය කර සිටිමු.**

**ඉහත සියළුම පරීක්ෂණ වලින් සමත් අයදුම්කරුවන් සඳහා 2018 අගෝස්තු මස තෙවන සතිය තුලම ඉදිරි සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිත බැවින් පහත සඳහන් ලිපිලේඛන සූදානම් කර තබාගත යුතුය.**

01. මේ සමඟ අමුණා ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර රැගෙන ආ යුතුය.
02. තම අධ්‍යාපන සුදුසුකම්, සේවා පලපුරුද්ද සහ වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතික.
03. පාසල් හැරයාමේ සහතිකයේ මුල් පිටපත සහ එහි ඡායා පිටපතක්
04. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකයක්
05. ජපානයේ රැකියා සඳහා විදේශගත වීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බවට අයදුම්කරුගේ දෙමාපියන්ගෙන් හෝ නීත්‍යානුකූල භාරකරුගෙන් ලිපියක්.
06. අයදුම්කරු තම පවුලේ අය සමඟ පදිංචි නිවස ඉදිරිපස සිටින සමූහ ඡායාරූපයක්.

**සාත්තු සේවිකා රැකියා කාණ්ඩය සඳහා අයදුම්කර පරීක්ෂණ වලින් සමත් අයදුම්කරුවන් පමණක් ඉහත ලිපිලේඛන වලට අමතරව පහත පරිදි ඡායාරූපද එදිනට රැගෙන පැමිණිය යුතුය.**

- ✓ ගමන් බලපත්‍රයේ වර්ණ ඡායාරූප 02ක්
- ✓ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 02ක් (පසුතලය සුදු වර්ණයෙන් විය යුතුය)
- ✓ 4 X 3 cm ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 08ක් (පසුතලය සුදු වර්ණයෙන් විය යුතුය)
- ✓ 2.5 X 2.5 cm ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 02ක් (පසුතලය සුදු වර්ණයෙන් විය යුතුය)
- ✓ 2 X 2 cm ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 03ක් (පසුතලය සුදු වර්ණයෙන් විය යුතුය)

**සැලකිය යුතුයි -** **සියළුම පරීක්ෂණ වලින් සමත් අයදුම්කරුවන් මාස 04ක පූර්ණ කාලීන නේවාසික පෙර විගමණික පුහුණුවක් (ජපානයේ රැකියා සඳහා පිටත්ව යාමට පෙර) සම්පූර්ණ කල යුතු බැවින් මේ වන විට රැකියා වල නියුතු අය මේ සඳහා ඉල්ලුම් කර ඇත්නම් ඒ පිළිබඳව සැලකිල්ලට ගෙන කටයුතු කරන මෙන් වැඩිදුරටත් අවධාරණය කරමු.**

වැඩි විස්තර සඳහා,

*කලමණාකරු*
*අලෙවිකරණ හා බඳවාගැනීම් (සාමාන්‍ය) අංශය*
*ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය*
***දු.අංක - 011 2791814, 011 4388295***
***විද්‍යුත් තැපැල - mgr_mkt@slbfe.lk***

*අයදුම්පත බාගත කර ගන්න.*